**ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය - 2019**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍යතත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය -ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, සංවිධානයේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තව දුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංවිධානය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංවිධානය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංවිධානය අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංවිධානය මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 විගණන විෂය පථය

--------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මඟින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය අගයන ලදි.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සංවිධානයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පටිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සංවිධානයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය ක්‍රියාකර ඇති බව,

- සංවිධානය සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

---------------

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

--------------------------------------------------------------

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අඩමාන ණය වෙන්කිරීම සඳහා වූ සංවිධානයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිය අනුව වසර 10 කට වඩා වැඩි ණය ශේෂය වෙනුවෙන් සියයට 25 ක් අඩමාන ණය සඳහා වෙන් කළයුතු වුවද වසර 10 ඉක්ම වූ රු.මිලියන 5.55 ණය ශේෂ වෙනුවෙන් රු.මිලියන 1.39 ක අඩමාණ ණය සඳහා වෙන් කිරීම් කර නොතිබුණි. | 2009 වර්ෂයේ ණයගැති ශේෂ සඳහා අඩමාණ ණය වෙන්කිරිම 2020 වර්ෂයේ සිට ගැලපීමට කටයුතු කරනු ලබන බව | ගිණුම් ප්‍රතිපත්ති අනුව අඩමාන ණය වෙන් කිරිම සිදු කළ යුතු ය. |

**1.5.3 ගිණුම්කරණ අඩුපාඩු**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සංවිධානය ද සම්බන්ධවී ක්‍රියාත්මක කරනු ලබන "ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මගින් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති" කාර්යාලය පවත්වාගෙන යාම සඳහා ගොඩනැගිලි කුලියට ලබාගෙන නොතිබුණු නමුත් එම ව්‍යාපෘතියට දරන ලද වියදමක් ලෙස රු.මිලියන 1.81 ක් සංවිධානයේ ගොඩනැගිලි කුලියෙන් අඩුකර මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.මෙම නිසා සමාලෝචිත වර්ෂයට අදාල ගොඩනැගිලි කුලිය එම ප්‍රමාණයෙන් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ස්ථාවර කිරීමේ ක්‍රමවේදය මඟින් අවදානම් අවම කිරීමේ ව්‍යාපෘති කාර්යාලය පවත්වාගෙන යාම සඳහා කාර්යාලයක් ලබා ගැනීමට සුදුසු ස්ථානයක් සෙවීමේදී මසකට රු.500,000 ක් වැනි විශාල අගයක් ඒ සඳහා අයකිරීමට සැපයුම්කරුවන් ලංසු ඉදිරිපත් කර තිබුණි. එම නිසා රු.150,000 ක් වැනි අඩු මුදලකට කාර්යාලය පවත්වාගෙන යාමට ස්ථානයක් ලබාදීමට අප සංවිධානය කටයුතු යොදා ඇත. මේ සඳහා එම ව්‍යාපෘති අධ්‍යක්ෂ තුමාගේ අනුමැතිය ඇතිව කුලියක් ලබාගැනීමට කටයුතු යොදා ඇත. | අය කරන ලද කුලිය ගොඩනැගිලි සඳහා ගෙවන ලද කුලියට හිලව් නොකර ආදායම් හා වියදම් වෙනම මූල්‍ය ප්‍රකාශන වල දැක්විය යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 1 හි 48 වන ඡේදයට අනුව ආදායම් හා වියදම් එකිනෙකට හිලව් නොකළ යුතු වුවද, එකතුව රු.මිලියන 27.87 ක් වූ වෙනත් වියදම් ශේෂයට පර්යේෂණ හා සංවර්ධන කටයුතු වෙනුවෙන් මහා භාණ්ඩාගාරයෙන් ලැබී තිබුණු රු. මිලියන 15.31 ක මුදල හිලව් කර වෙනස වූ රු.මිලියන 12.56 ක මුදල පමණක් වෙනත් වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි | පර්යේෂණ හා සංවර්ධන වියදම් ප්‍රාග්ධන වියදමක් ලෙස සලකා වියදම්වලින් ඉවත් කර ඇත. ඉදිරියේදී වියදම අදාල ස්ථානයෙන් අඩු කිරීමට කටයුතු කරනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ප්‍රමිතයේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 1 හි 76 ඡේදයට අනුව වර්ෂයක් ඇතුළත උපලබ්ධි කර ගැනීමට අපේක්ෂිත වත්කම් ජංගම වත්කම් යටතේ මූල්‍ය තත්ත්ව | 2020 වර්ෂයේ දී නිවැරදි කිරීමට කටයුතු යොදනු ලැබේ. | ප්‍රමිතයේ සඳහන් පරිදි වත්කම් වර්ගීකරණය කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ප්‍රකාශයේ දැක්විය යුතු වුවද, වර්ෂයකට වැඩි කාලයක් සඳහා ආයෝජනය කර තිබුණු සංවිධානයේ රු. මිලියන 463.89 ක් වූ ස්ථාවර තැන්පත් වටිනාකම ජංගම වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | | |
| (ඇ) | පර්යේෂණ සංවිධානයේ දිස්ත්‍රික් කාර්යාලවලින් ප්‍රධාන කාර්යාලය වෙත ප්‍රේෂණය කර තිබුණු රු.මිලියන 1.52 ක් අදාල ගිණුම් වලට ගලපනු වෙනුවට ජංගම වගකීම් යටතේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | මෙම ප්‍රේෂණ හඳුනාගැනීම සඳහා කිසිදු අංකයක් හෝ තොරතුරක් සටහන් නොකර සෘජුව මුදල් සංවිධානයේ ගිණුමේ තැන්පත් කිරීම නිසා මෙම තත්ත්වය උද්ගතවී ඇති අතර, ණය එකතු කිරීම සඳහා පත්කර ඇති කමිටුව මඟින් මෙම මුදල් හැකිතාක් හඳුනාගැනීමට කටයුතු යොදා ඇත. ඒ අනුව 2020 වර්ෂයේ මෙම හඳුනානොගත් ප්‍රේෂණ සඳහා නිසි ගැලපීම් කිරීමට කටයුතු කරමින් පවතී. | ප්‍රධාන කාර්යාලය වෙත කරනු ලබන ප්‍රේෂණ හඳුනාගැනීමට ක්‍රමවේදයක් සකස්කර එම ප්‍රේෂණ නිවැරදිව ගිණුම්වල ගැලපීමට කටයුතු කළ යුතුය. |
| (ඉ) | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 15 අනුව සංවිධානයේ අයවැයගත තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි | 2020 වර්ෂයේදී අයවැයගත සංඛ්‍යා මූල්‍ය ප්‍රකාශනවල වෙනම තීරුවක ඇතුලත් කිරීමට කටයුතු යොදනු ලැබේ. | මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේදී ප්‍රමිතයේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පුස්සල නවෝදා විද්‍යාලයේ සහ බදුල්ල වැවේගම රෝහල් පරිශ්‍රයේ සිදු කළ නායයෑම් අවම කිරීමේ ව්‍යාපෘති සම්බන්ධ ඉදිකිරීම් කොන්ත්‍රාත් ලබාගෙන තිබූ කොන්ත්‍රාත්කරුවන් 2016 වර්ෂයේදී කොන්ත්‍රාත්තු කටයුතු අත්හැර දමා තිබුණි. සංවිධානය වෙත සිදු වූ අලාභයන් ආවරණය කර ගැනීම සඳහා එම කොන්ත්‍රාත්කරුවන් විසින් | මෙම ඇපකර සඳහා වන මුදල් අයකර ගැනීම පිළිබඳව ඔවුන් සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු කරමින් පවතී. | සංවිධානයට වන අලාභයන් අය කරගැනීම සඳහා අදාල ඇපකර වලින් අලාභ අයකර ගැනීමට කටයුතු කල යුතුය. |

| | | | |
|---|---|---|---|
| | ලබාදී තිබුණු අත්තිකාරම් ඇපකර වලින් රු.මිලියන 1.66 ක් ද එම ව්‍යාපෘතිවල කාර්යසාධන ඇපකර වලින් වූ රු.මිලියන 1.57 ක් ද 2019 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | | |
| (ආ) | 2009 වර්ෂයේ සිට සංවිධානයේ මූල්‍ය ප්‍රකාශනවල නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු රු.මිලියන 5.92 ක ශේෂයක් අඛණ්ඩව දක්වා තිබුණ ද , අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු ශේෂයක් වශයෙන් එම වටිනාකම දක්වා නොතිබුණු බැවින් එම මුදල අයකර ගැනීම අවිනිශ්චිතව පැවතුණි. එසේම සංවිධානය වෙත අයවිය යුතුව ඇති ටෙන්ඩර් ඇප තැන්පතු රු. 575,722 ක් සහ නායයෑම් අවදානම් තක්සේරු වාර්තා නිකුත් කිරීම වෙනුවෙන් ප්‍රාදේශිය සභාවලින් අයවියයුතු රු. 477,882 ක් 2019 දෙසැම්බර් 31 දින වනවිටත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | නාගරික සංවර්ධන අධිකාරියෙන් මෙම මුදල අයකර ගැනීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියට ක්‍රීඩා අමාත්‍යාංශයට, හා මහා භාණ්ඩාගාරයට අමාත්‍යාංශ ලේකම් මඟින් ලිපි ඉදිරිපත් කරන ලද අතර මෙතෙක් සාර්ථක කර ගැනීමට අවකාශය ලැබී නොමැති බවත් මෙම ඇපකර සඳහා වන මුදල් අයකර ගැනීම පිළිබඳව ඔවුන් සමඟ සාකච්ඡා කර ඉදිරි කටයුතු කරමින් සිටින බවත් පළාත් පාලන ආයතන වෙතින් එම මුදල් අයකර ගැනීම සඳහා සිහිකැඳවීම් යැවීමට කටයුතු කර ඇති බවත් දක්වා ඇත. | ණය අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් යෙදිය යුතුය. |
| (ඇ) | ණය පදනම මත සේවා සැපයිම සංවිධානයේ ප්‍රතිපත්තිය නොවුවද, පරිසර අධ්‍යනය සහ සේවා හා භූ තාක්ෂණික සහ ඉංජිනේරු යන අංශ දෙක මගින් සමාලෝචිත වර්ෂයේදි ණයට සේවා සැපයිම වෙනුවෙන් 2019 දෙසැම්බර් 31 වන විට පිළිවෙලින් රු. මිලියන 4.08 ක් සහ රු.මිලියන 23.14 ක් අයවිය යුතුව තිබුණි. 2018 හා 2019 යන වර්ෂ දෙකට අදාළව රු. මිලියන 37.50 ක් අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි. | ණයට වැඩ කිරීම ආයතනයේ ප්‍රතිපත්තිය නොවූව ද රාජ්‍ය ආයතන සඳහා වැඩ කිරීමේ දී මෙම ප්‍රතිපත්තියෙන් පරිබාහිරව කටයුතු කිරීමට සිදු වේ. මෙම ණයගැතියන්ගෙන් බොහොමයක් රාජ්‍ය ආයතනවලින් අයවිය යුතු මුදල් වේ. තවද මෙම රාජ්‍ය ආයතන සමඟ ගිවිසුම්වලට එළඹීමෙන් පසු අදාල සේවා සපයා ඇත. | ණය අයකර ගැනීමට විධිමත් වැඩපිළිවෙලක් යෙදිය යුතු අතර ගිවිසුම් අනුව කටයුතු කළ යුතුය. |

### 1.6.2 ගෙවිය යුතු මුදල්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා ටෙන්ඩර් ඇප තැන්පත් ලෙස ලබාගෙන තිබුණ රු. 991,152 ක් නිරවුල් කිරීමට පියවර ගෙන නොතිබුණි. | අදාල සැපයුම්කරුවන්හට ටෙන්ඩර් ඇපතැන්පතු ලබාගන්නා ලෙස දැනුම් දුන්නද මේ දක්වා එම තැන්පතු ලබා ගැනීමට කටයුතු කර නොමැත. | බාහිර බැදීම් නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 2013 ඔක්තෝබර් 09 දිනැති අංක 21/2013 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සංශෝධිත ආයතන සංග්‍රහයේ VIII පරිච්ඡේදයේ 10.1 වගන්තිය | මසකට දින 2 කට වැඩියෙන් සති අන්ත සහ රජයේ නිවාඩු දිනවල නිළධාරින් සේවයේ යොදවා ගෙන ගෙවීම් කිරීම සඳහා අමාත්‍යාංශ ලේකම් වරයාගේ අනුමැතිය ලබා ගත යුතුය. එසේ වුවත් එම අනුමැතිය ලබාගැනීමකින් තොරව දින දෙකකට වැඩියෙන් සේවය කල නිලධාරීන් සඳහා රු.මිලියන 6.13 ක් ගෙවා තිබුණු අතර මෙම ගෙවීම් මත පදනම්ව සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල වෙත එකතුව රු.918,920 ගෙවීම්ද සිදු කර තිබුණි. | හදිසි ආපදා කටයුතු, කඩිනමින් ඉටුකලයුතු කාර්යයන් හා ප්‍රමාද කල නොහැකි මුදල් ගෙවා සිදුකරන උපදේශන හා පරික්ෂණ සේවා නිසිපරිදි නිමකිරීමට රජයේ නිවාඩු දිනවල නිලධාරීන් සේවයේ යෙදවීමට සිදුවී ඇත. තවද මුදල් රෙගුලාසි 135 බලය පැවරීමේ විධිවිධාන යටතේ ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ ගෙවීම් අනුමත කිරීමේ සහ බලය පැවරීමේ අධිකාරී සීමාවන් ආපදා කළමනාකරණ අමාත්‍යාංශයේ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවති අන්තර් කාලීන කළමනාකරණ කමිටුව මඟින් අනුමත කර ඇත. ඉදිරියේදී මෙම දීමනා ගෙවීම් විධිමත් | ආයතන සංග්‍රයේ විධිවිධාන අනුගමනය යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කිරීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ අංක 03/2020 මඟින් කටයුතු යොදා ඇත. | |
| (ආ) | ආයතන සංග්‍රහයේ VIII පරිජේදයේ 7 වගන්තිය | අතිකාල දීමනා ගෙවිය හැකි ශ්‍රේණිවල නිලධාරීන් සඳහා මසකට පැය 20 ක කාලයක් සඳහා අතිකාල ගෙවිය හැකි වුවත්, එම උපරිම කාලය ඉක්මවා අතිකාල ගෙවීම සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතිය ලබා ගත යුතුවේ. එසේ වුවත් උපරිම සීමාව ඉක්මවා තිබුණු අතිකාල අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබා නොගෙන ගෙවා තිබුණි. | හදිසි ආපදා කටයුතු, කඩිනමින් ඉටුකලයුතු කාර්යයන් හා ප්‍රමාද කල නොහැකි මුදල් ගෙවා සිදුකරන උපදේශන හා පරීක්ෂණ සේවා නිසිපරිදි නිමකිරීමට මසකට පැය 20 කට වඩා වැඩි කාලයක් අමතර රාජකාරී වැඩවල යෙදීමට සිදුවී ඇත. මේ සඳහා අමාත්‍යාංශයේ ලේකම්ගේ සහභාගිත්වයෙන් යුතු ජා.ගො.ප.සංවිධානයේ අන්තර් කළමනාකරණ කමිටුව විසින් අනුමත වාර්ෂික බලය බෙදීමේ අනුමැතිය යටතේ ආයතන ප්‍රධානියාට අතිකාල පැය 100 ක් දක්වා අනුමත කිරීමේ බලය ලබා දී ඇත. ඉදිරියේදී මෙම දීමනා ගෙවීම් විධිමත් කිරීම සඳහා අභ්‍යන්තර චක්‍රලේඛ අංක 03/2020 මඟින් කටයුතු යොදා ඇත. මින් ඉදිරියට අඛණ්ඩව වැඩ කිරීම සීමා කිරීමට කටයුතු කරනු ලැබේ. | ආයතන සංග්‍රයේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | 2016 අප්‍රේල් 04 දිනැති අංක 02/2016 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛයේ 13.2 ජේදය | ආයතන සංග්‍රයේ VIII පරිච්ඡේදයේ 6.1 උපවගන්තියේ සඳහන් විධිවිධාන වලට පටහැනිව අතිකාල පැයකට ගෙවිය යුතු දීමනාව තීරණය කර අතිකාල ගෙවීම නිසා | ආයතනය ආරම්භයේ සිට සාප්පු හා සේවක කාර්යාල පනතේ විධිවිධාන අනුව ආයතනයේ කටයුතු මෙහෙයවා ඇත. ඒ යටතේ අතිකාල පැයට පැය 1 ½ වශයෙන් | ආයතන සංග්‍රයේ විධිවිධාන වලට අනුව කටයුතු කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| | | 2019 වර්ෂයේදී අතිකාල දීමනා ලෙස රු. මිලියන 8.83 ක් සහ ඊට අදාළ සේවක අර්ථසාධක අරමුදලට සහ සේවක භාරකාර අරමුදලට එකතුව රු.මිලියන1.32 ක් සංවිධානය විසින් වැඩිපුර ගෙවා තිබුණි. | ගෙවීම් කර ඇත. ඉදිරියේදී කළමනාකරණ චක්‍රලේඛ අංක 02/2016 අනුව 2020.07.01 දින සිට කටයුතු කිරීමට පියවර ගනු ලබන බව වාර්තා කරමි. | |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජන රජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 104 | තොග පාලනයේ සිදු වී ඇති අක්‍රමිකතා හේතුවෙන් 2019 දෙසැම්බර් 31 දිනට භෞතික තොග වටිනාකම හා තොග පාලන ගිණුමේ ශේෂය අතර රු. 400,824 ක වෙනසක් නිරීක්ෂණය විය. මෙකී පාඩුව පූර්ණය කරගැනීමට මෙම රෙගුලාසිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | මෙම ගැලපීම ලිපිද්‍රව්‍ය තොග සඳහා යොදා ඇති ගැලපුමකි. භාණ්ඩ නිකුත් කරන අවස්ථාවේදී සමහර නිකුත් කිරීම් ලෙජරයට පිටපත් වී නොමැති නිසා තොග වටිනාකමට වඩා වැඩි වටිනාකමක් ලෙජරයේ දක්වා ඇත.මේ සම්බන්ධ සැසඳුම් ප්‍රකාශයක් ඉදිරියේදී ලබාදීමට කටයුතු කරනු ලැබේ. | ඌනතාවය අදාල පාර්ශවයන් ගෙන් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 1.8 බදු රෙගුලාසිවලට අනුකූල නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සංවිධානය මගින් සකස්කර තිබුණු ජාතිය ගොඩනැගීමේ බදු වාර්තාවන්ට අනුව 2019 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ජාතිය ගොඩනැගීමේ බද්ද රු.මිලියන1.12 ක් වුවද සංවිධානයේ මූල්‍ය ප්‍රකාශනවලට අනුව එම බද්ද දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්වරයාගෙන් අයකරගතයුතු බද්දක් ලෙස රු.මිලියන 2.54 ක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. එසේම සංවිධානයේ එකතුකළ අගය මත බදු වර්තාවන්ට අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ප්‍රතිපූර්ණය කරගතහැකි එකතු කළ අගය මත බදු වටිනාකම රු.මිලියන7.31 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව එම අගය රු.මිලියන 10.06 ලෙස දක්වා තිබුණි. | මේ සම්බන්ධව සැසඳීම් වාර්තාවක් පිළියල කිරීමට කටයුතු යොදා ඇත. | එකතු කළ අගය මත බදු වටිනාකම නිවැරදිව ගිණුම් ගතකිරීමට පියවර ගතයුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 55.24 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. මිලියන 63.68 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.මිලියන 8.44 ක පිරිහීමක් නිරීක්ෂණය විය. මෙම පිරිහීමට ස්ථාවර තැන්පත් මත උපයාගත් පොළී ආදායම අඩුවීම වීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

### 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

#### 2.2.1 පර්යේෂණ සංවිධානයේ එක් එක් අංශවල අතිරික්තය 2019 වර්ෂයට සාපේක්ෂව වර්ධනය වීම හෝ පිරිහීම

භූතාක්ෂණික සහ ඉංජිනේරු හා ව්‍යාපෘති කළමනාකරණ යන අංශවල අතිරික්තය 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී සියයට 17 සහ 20 වූ අතර පරිසර අධ්‍යයන සහ සේවා, නායයෑම් පර්යේෂණ සහ අවදානම් කළමනාකරණ, මානව ජනාවාස සැලසුම් සහ පර්යේෂණ හා ගොඩනැගිලි ද්‍රව්‍ය පරීක්ෂණ යන අංශවල 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී සියයට 0.50 සිට 30 දක්වා පරාසයක් තුල පසුබෑමක් නිරීක්ෂණය වේ.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| පර්යේෂණ සංවිධානය සඳහා නීතිමය තත්ත්වය ප්‍රදානය කිරීම වෙනුවෙන් පනතක් පිළියෙල කිරීම සඳහා ඉදිරිපත් කර තිබුණු අමාත්‍ය මණ්ඩල සංදේශය සඳහා 2010 ජුනි 02 දින අනුමැතිය ලැබී තිබුණු අතර ඒ අනුව පිළියෙල කළ පනත් කෙටුම්පත 2012 සැප්තැම්බර් 10 දින නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යොමුකර තිබුණි. කෙසේ වෙතත් අදාළ පනත 2019 දෙසැම්බර් 31 දින වනතුරුත් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අප සංවිධානය අයත්ව තිබූ අමාත්‍යාංශ හා විෂය පථයන් කිහිප වරක් වෙනස්වීම සමඟ සංශෝධිත කෙටුම්පත් පනත නැවත නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව මඟින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමුකර ඇති අතර ඒ පිළිබඳව තවදුරටත් අධ්‍යනය කරමින් පවතී. එහි අනුමැතිය ලැබුණු පසු පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරනු ලබන බව වාර්තා කරමි. | කඩිනමින් පනත සම්මත කරගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

## 3.2 අරමුදල් ඌන උපයෝජනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ප්‍රජා මූලික ආපදා අවම කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා සහ නායයෑම් විස්තාපන හඳුනාගැනීමේ පද්ධති වෙනුවෙන් 2015 වර්ෂයේදී එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන මගින් ලැබී තිබුණු රු.මිලියන 7.62 ක් 2019 දෙසැම්බර් 31 දින වන විටත් අදාල කාර්යයන් සඳහා උපයෝජනය කර නොතිබූ අතර නායයෑම් අවදානම් අවම කිරීමේ අංශය වෙත 2015 වර්ෂයේදී මහා භාණ්ඩාගාරයෙන් ආංකික ආකෘති වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් ලැබී තිබුණ රු.මිලියන 5 ක මුදල 2019 දෙසැම්බර් 31 දින වන විටත් උපයෝජනය කර නොතිබුණි. | ඉදිරියේදී මෙම මුදල් අවශ්‍යතාවය අනුව අදාල කාර්යය සඳහා යෙදවීමට බලාපොරොත්තු වෙමි. | ප්‍රදානයන් සහ ප්‍රතිපාදයන් අදාල අරමුණු වෙනුවෙන් උපයෝජනය කිරීමට පියවර ගතයුතුය. |

## 3.3 ව්‍යාපෘති හෝ ප්‍රාග්ධන වැඩ ප්‍රමාදයන්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) නායයෑම් අවදානම අවම කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුලදී මහා භාණ්ඩාගාරයෙන් පර්යේෂණ සංවිධානය වෙත රු. මිලියන 200 ක් ලබා දි තිබුණි. එම මුදලින් රු. මිලියන 35 ක් උක්ත කරුණට අදාළ නොවූ විශේෂ භූමි පරීක්ෂණ කටයුතු සඳහා උපයෝජනය කර තිබුණි. එයින් ඉතිරි රු.මිලියන 165 උපයෝගී කරගෙන ව්‍යාපෘති 8 ක් ඉටු කිරිමට රු.මිලියන 160.18 ක ඇස්තමේන්තුවක් සකස් කර රු. මිලියන 132.92 ක වටිනාකමකට කොන්ත්‍රාත් | මහා භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන රු.මිලියන 35 ක මුදලක් විශේෂ භූමි පරීක්ෂණ කටයුතු සඳහා මාරු කර ඇත. ව්‍යාපෘති 02 ක වැඩ සම්පූර්ණයෙන් අවසන් කර ඇති අතර අනෙකුත් වැඩ 2020 මාර්තු 31 දින වන විට නිම කිරීමට සැලැසුම් කර තිබුණද රටේ උද්ගතවී ඇති තත්ත්වය අනුව එදිනට නිම කිරීමට නොහැකි වූ බැවින් එම වැඩ ජුලි 15 වන දින නිමකිරීමට සැලසුම් කර ඇත. | කොන්ත්‍රාත් වැඩ සඳහා නිවැරදිව ඇස්තමේන්තු පිළියෙල කිරීමට කටයුතු කළ යුතු අතර අදාල වැඩ කොටස් සැලසුම් කළ පරිදි නිමකර ගැනීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| | පිරිනමා තිබුණි. 2020 පෙබරවාරි 28 දින වන විට මෙම ව්‍යාපෘති 08 හි ඉදිකිරීම් අවසන් කළයුතු වුවත් එම කටයුතු අවසන් කර නොතිබුණි. | | |
| (ආ) | පර්යේෂණ සංවිධානය විසින් ඉදිකරමින් පවතින නව කාර්යාල හා විද්‍යාගාර ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා වූ කොන්ත්‍රාත්තුව පිළිගත හැකි සාධාරණ හේතුවක් නොමැතිව දින 623 ක අතිරේක කාලයක් ලබාදී තිබුණ අතර දින 162 ක කාලය වෙනුවෙන් ප්‍රමාද ගාස්තු ලෙස රු.මිලියන 1.62 අයකර ගෙන නොතිබුණි.<br>කොන්ත්‍රාත්තුවේ ප්‍රමාණ පත්‍රිකාවල වූ වැඩ විචලනයන් වෙනුවෙන් රු.මිලියන 43.12 ක් ගෙවා තිබූණ ද ඒ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ 8.13.4 වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. ගොඩනැගිල්ල ඉදිකිරිම ප්‍රමාද වීම හේතුවෙන් සංවිධානයෙ අංශ කිහිපයක් පවත්වාගෙන යාම සඳහා කුලියට ලබාගෙන තිබුණ ගොඩනැගිලි සඳහා බදු කුලී සහ ආරක්ෂක සේවා වෙනුවෙන් 2019 වර්ෂයේදී රු. මිලියන 6.36 ක් සහ ඉදි කිරීම් කටයුතු හා සම්බන්ධ සංවිධානයේ නිලධාරීන්ගේ දායකත්වය වෙනුවෙන් රු. මිලියන 9.60 ක් අතිරේකව ගෙවා තිබුණි. | • මෙම ගොඩනැගිල්ලේ ඉදිකිරීම් සීමිත ඉඩකඩ මධ්‍යයේ සිදු කරන අතර දිවා කාලයේ ආයතනයේ ඇති රථවාහන තදබදය නිසා කොන්ක්‍රීට් ට්‍රක් රථ ගෙන්වීමට අපහසුවීම<br>• පසු පිරවුම (Back fill) සඳහා පස් ප්‍රවාහනය කිරිමට භූ විද්‍යා හා පතල් කාර්යාංශයේ අනුමැතිය නොලැබුණු නිසා ගොඩනැගිල්ලේ ඉදිකිරිම මාස 03 ක් පමණ ප්‍රමාද විය.<br>• මුළු සැලසුම් සහ කොන්ත්‍රාත්තුව කරගෙන යන කාලය අතරතුර තුල නවීන විද්‍යාගාර උපකරණ මිලදීගත් බැවින් සැලසුම වෙනස් කිරිමේ අවශ්‍යතා වරින්වර මතුවිය.<br>• ඉහත දැක්වූ වැඩි දියුණු කිරීම අනුව Stiffner Column වැඩි කිරීමට සිදුවිය මේ සඳහා අමතර කාලයක් සහ වැඩ කොටසක් කිරීමට සිදුවිය<br>• ශ්‍රවනාගාරයේ ප්‍රමාණය වැඩි කිරිමේ අවශ්‍යතාවයක් ඇති විය. එහි සැලසුම් සකස් කිරිම සඳහා අමතර කාලයක් ගත විය.<br>• කාලගුණයේ සිදුවූ අයහපත් තත්ත්වය නිසාද ගොඩනැගිල්ලේ කටයුතු ප්‍රමාද විය.<br>ඉහත කරුණු කොන්ත්‍රාත්කරුගේ පාලනයෙන් තොර නිසා ඔහුට කාලය දීර්ඝ කිරිම ලබා දීමට සිදු වීම මත ප්‍රමාද ගාස්තු අයකිරීමට කටයුතු නොකරන ලද බවත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශන සංග්‍රහයේ 8.13.4. ජේදයේ සඳහන් විධිවිධානයන්ට අනුව අමාත්‍යාශ | අතිරේක කාලය සඳහා ප්‍රමාදම ගාස්තු අය කිරීමට පියවර ගතයුතු අතර විචලනය සියයට 34 බැවින් ඒ සඳහා අමාත්‍යාංශ ලේකම් ගේ අනුමැතිය ලබාගත ගතයුතුය. අතිරේක වියදම් පාලනය තුලින් පිරිවැය අවම කිරීමට පියවර ගතයුතුය. |

| | | |
|---|---|---|
| | ලේකම්ගේ අනුමැතිය ලබා ගත යුතු වන්නේ කොන්ත්‍රාත් වටිනාකම 10% ඉක්මවන්නේ පමණක් බවත් අතිරේක මුදල් දැරීමට සිදු වුව ද ගොඩනැලිල්ල තුල සිදු කරන ලද සියලුම වෙනස්කම් සංවිධානයේ වර්තමාන හා අනාගත අවශ්‍යතාවයන් මත සිදු කර ඇති නිසා දිර්ඝකාලීන ව එහි ප්‍රතිලාභ ආයතනය වෙත ලැබීම තුලින් ආයතනයට පාඩුවක් සිදු නොවන බව දන්වා ඇත. | |

**4. ප්‍රසම්පාදන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ප්‍රධාන කාර්යාලය වෙත වාහන සපයා ගැනීම සඳහා ලංසු කැඳවීමේදී අවම ලංසු මිල ඉදිරිපත් කර තිබුණ ආයතනය අසාධු ලේඛන ගත කළ ආයතනයක් බවට සාවද්‍ය ලෙස කරුණු දක්වා එම ආයතනය ඇගයීමෙන් ඉවත්කර වෙනත් ආයතනයක් වෙත කොන්ත්‍රාත්තු පිරිනැමීම හේතුවෙන් වාර්ෂිකව රු.මිලියන 5.47 ක අතිරේක වියදමක් දැරීමට සංවිධානයට සිදුවී තිබුණි. එසේම දිස්ත්‍රික් කාර්යාල වෙත වාහන සපයන ආයතනයෙන්ම මාසික කුලිය රු. 132,000 ගෙවීමට ලබාගෙන තිබුණ කැබ් රථයක සේවය නවතා ප්‍රධාන කාර්යාලය වෙත වාහන සපයන ආයතනයෙන් මාසික කුලිය රු. 185,000 ක් ගෙවීමට කැබ් රථයක් ලබාගෙන තිබුණ අතර ඒ වෙනුවෙන් වාර්ෂිකව රු.636,000 ක් ද අතිරේක ගෙවීමක් කිරීමට සංවිධානයට සිදුවී තිබුණි. | 2017 වර්ෂයේ වාහන සැපයීම සඳහා ප්‍රයිම් ටුවර්ස් ආයතනයට ටෙන්ඩර් ප්‍රදානය කර තිබුණි. එහෙත් එම ආයතනය නිසි පරිදි වාහන සැපයීමට අපොහොසත් වීම හේතුවෙන් අංක NBRO/DPC.2017.078 හා 2017.11.01 දිනැති ටෙන්ඩර් තීරණය මගින් ප්‍රයිම් ටුවර්ස් ආයතනය අසාධු ලේඛණගත කිරීමට තීරණය කර ඇත. එය ටෙන්ඩර් තීරණයේ පැහැදිලිව සඳහන්ව ඇති බවත් දිස්ත්‍රික් කාර්යාල වෙත වාහන සැපයීම සඳහා ලබාදී තිබූ සැපයුම්කරු සපයන ලද ඩබල් කැබ් රථය ඉවත් කර ගැනීමෙන් පසුව වෙනත් සුදුසු රථයක් සැපයීමට සැපයුම්කරු ක්‍රියා නොකිරීම හේතුවෙන්, ප්‍රධාන කාර්යාලයට වාහන ලබා ගැනීමට මිළ ගණන් කැඳවන අවස්ථාවේදී ඩබල් කැබ් රථයක් වෙනුවෙන් මිළ ගණන් ලබාගෙන ටෙන්ඩර් ප්‍රදානය සිදු කර ඇත. | සත්‍ය හා පිළිගත හැකි තොරතුරු මත ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කර ලංසු ඇගයීමට ලක් කළ යුතු අතර ආයතනයට උපරිම ආර්ථික වාසියක් ලැබෙන පරිදි භාණ්ඩ හා සේවා සපයා ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | කඩුවෙල සිට හංවැල්ල දක්වා කැලණි ගං ඉවුර දෙපස මූලික භූතාක්ෂණික පරීක්ෂාවක් සිදුකිරීමේ කොන්ත්‍රාත්තුවක් සංවිධානය වෙත ලැබී තිබුණ අතර ඊට අදාළ කෝන්පෙනට්‍රේෂන් ටෙස්ට් සිදුකිරීමේ කාර්යයන් ඉටුකර ගැනීම සඳහා සීමිත ලංසු කැඳවීම මගින් උපකොන්ත්‍රාත්කරුවෙකු තෝරා ගෙනතිබුණි. ලංසු කැඳවීම සඳහා ආයතන තෝරා ගැනීම සහ ලංසු විවෘත කිරීම විනිවිදභාවයෙන් සිදුකර නොතිබුණ අතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4(ඇ) වගන්තිය ප්‍රකාරව බාහිර සමාජිකයකු තාක්ෂණික ඇගයීම් කමිටුව සඳහා පත්කර නොතිබුණි. මේ සඳහා ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 වගන්තිය ප්‍රකාරව කාර්යසාධන ඇපකරයක් ලබාගෙන නොතිබුණ අතර එකඟ වූ කොන්ත්‍රාත් වටිනාකමට අතිරේකව රු.මිලියන 1.4 ක් ගෙවා තිබුණි. | ලංසු ආරාධනා අදාල ආයතන වෙත ලියාපදිංචි තැපෑලෙන් සහ විද්‍යුත් තැපෑලෙන් යොමු කරන ලද අතර ලංසු විශ්ලේෂණය කිරීම සඳහා අත්දැකීම් ඇති න්‍යායික සහ ප්‍රායෝගික අත්දැකීම් සහිත භාහිර සාමාජිකයෙකු උපදේශණ සමාගම (Atkins) විසින් ලබාදුන් කාලය තුල සොයා ගැනීමට අපහසු විය. අදාළ කාර්යය සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරුට කිසිඳු අත්තිකාරම් මුදලක් නොදෙන ලද අතර එම ආයතනය සමග අදාල කාර්යය නිමකර අවසන් වාර්තාව අපවෙත ලබාදෙන තෙක් කිසිඳු මුදලක් නොගෙවීමට තීරණය විය. ඇස්තමේන්තු පිළියෙල කර භූ අස්තාවරත්වය පිළිබඳ මූලික අධ්‍යනයක් සිදු නොකරන අතර එය හුදෙක් අප සතු දැනුම සහ අත්දැකීම් පදනම් කරගෙන සිදු කරන ලද උපකල්පන මත පමණක් පිළියෙල කරන ලද දළ ඇස්තමේන්තුවක් පමණි. එබැවින් අදාල පර්යේෂණ නිමා වන විට භූ අභ්‍යන්තර ලක්ෂණ මත මූලික ඇස්තමේන්තුවෙන් ඔබ්බට ඇති විචල්‍ය නොවැලැක්විය හැකි කරුණකි. | කොන්ත්‍රාත් ඇගයීමේදී හා පිරිනැමීමේදී විනිවිද භාවයකින් යුතුව කටයුතු කළ යුතු අතර සෑම අවස්ථාවකම සුදුසු ඇපකර ලබා ගැනීමට කටයුතු කළ යුතුය. එසේම ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රයේ විධිවිධාන අනුව කටයුතු කළ යුතුය. |

**5. මානව සම්පත් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2019 දෙසැම්බර් 31 දිනට සංවිධානයේ අනුමත කාර්ය මණ්ඩලය නිලධාරීන් 386 ක් වුවද සේවයේ නියුතු කාර්ය මණ්ඩලය 459 ක් විය. මෙයින් සේවකයන් 117 ක් ස්ථිර කාර්ය මණ්ඩලයට අයත් නොවන නිලධාරීන් වන බව අනාවරණය විය. | ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානය වෙනුවෙන් කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් 386 ක කාර්ය මණ්ඩලයක් අනුමත කර ඇත. මෙම කාර්ය මණ්ඩලය තුල සේවයේ නියුතු ස්ථිර සේවකයින්ට අමතරව ආයතනයට අවස්ථාවෙන් අවස්ථාවට ලැබෙන විශේෂ උපදේශනාත්මක වැඩ සඳහා එම කාර්යයට සීමාවනසේ වරින් වර අනියම් පදනමින් සේවකයින් ලබා ගැනීම සිදු කරනු ඇත. එම කාලය අවසන් වූ පසු එම සේවකයින් ඉවත් කිරීම සිදු කරනු ලැබේ. එසේ වෙතත් මෙම අනියම් කාර්යය මණ්ඩලයේ සේවා කාලය ජුනි මස 30 වන දිනෙන් අවසන් කිරීමට කටයුතු කර ඇත. | අදාල අනුමැතීන් ලබාගෙන අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නොයන පරිදි කටයුතු කිරීමට පියවර ගතයුතුය. |